# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1776/11 - 2012 සැප්තැම්බර් මස 18 වැනි අඟහරුවාදා - 2012.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 7/2009.

**1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත**

1984 අංක 38 දරන පනත මගින්, 1987 අංක 25 දරන පනත මගින් සහ 1993 අංක 12 දරන පනත මගින් සංශෝධිත මෙම පනතේ 11 වැනි වගන්තිය යටතේ කියවිය යුතු 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනතේ 38 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
සෞඛ්‍ය අමාත්‍යවරයා.

2012 සැප්තැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1992 ජූලි මස 06 වැනි දින අංක 722/2 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් සංශෝධිත 1985 දෙසැම්බර් මස 02 වැනි දින අංක 378/3 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1984 අංක 38 දරන ඖෂධ නියෝගවල 83 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන නියෝගය ඇතුලත් කිරීම මගින් එකී නියෝග මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලබන අතර, එම නියෝගය 83 අ නියෝගය ලෙස බලපැවැත්විය යුතු ය.

"83 අ (1) විද්‍යුත් මාධ්‍ය හෝ මුද්‍රිත මාධ්‍ය භාවිත කරමින් හෝ ලේබල්වල හෝ ඇසුරුම්වල හෝ නිෂ්පාදිතය සමග ඇති තොරතුරු පත්‍රිකාවල මුද්‍රණය කිරීම මගින් පොදු මහජනතාව වෙත කරනු ලබන සෑම වෙළඳ ප්‍රචාරක දැන්වීමක ම -

(i) පැරසිටමෝල් සිරප් සම්බන්ධයෙන් "ප්‍රමාණය ඉක්මවූ බෙහෙත් වේලක් අක්මාවට අහිතකර වියහැකි බැවින්, නිර්දේශිත බෙහෙත් ප්‍රමාණය සහ වාර ගණන ඉක්මවා භාවිතා නොකරන්න. තව දුරටත් උණ පවතී නම් ඔබගේ වෛද්‍යවරයාගෙන් උපදෙස් ලබාගන්න." යනුවෙන් වූ ප්‍රකාශය අන්තර්ගත විය යුතුය ; සහ

(ii) පැරසිටමෝල් බෙහෙත් පෙති සම්බන්ධයෙන් "ප්‍රමාණය ඉක්මවූ බෙහෙත් වේලක් අක්මාවට අහිතකර වියහැකි බැවින්, නිර්දේශිත බෙහෙත් ප්‍රමාණය සහ වාර ගණන ඉක්මවා භාවිතා නොකරන්න. තව දුරටත් රෝග ලක්ෂණ පවතී නම් ඔබගේ වෛද්‍යවරයා ගෙන් උපදෙස් ලබාගන්න" යනුවෙන් වූ ප්‍රකාශය අන්තර්ගත විය යුතු ය.

(2) මෙම නියෝගය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමේ දින සිට මාස 02 ක කාලයක් ඉක්මවීමෙන් පසුව බලාත්මක වන්නේ ය."

10-220/1

1A - G 016610 — 345 (2012/09)

එල්.ඩී.බී 7/2009.

**1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත**

1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනතේ 38 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
සෞඛ්‍ය අමාත්‍යවරයා.

2012 සැප්තැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

1985 දෙසැම්බර් මස 02 වැනි දින අංක 378/3 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1984 අංක 38 දරන විලවුන් නියෝගවල 39 වන නියෝගයෙන් ඉක්බිතිවම පහත දැක්වෙන නියෝගය ඇතුලත් කිරීමෙන් එකී නියෝග මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එම නියෝගය 39 අ නියෝගය වශයෙන් බලාත්මක විය යුතු ය.

"39 අ (1) අධිකාරියේ පූර්ව ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තකු යම් විලවුන් වර්ගයක් ප්‍රචාරනය කරනු නොලැබිය යුතු ය.

(2) මෙම නියෝගය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට මාස දෙකක කාල සීමාවක් ඉකුත්වීමෙන් පසු බලාත්මක විය යුතු ය."

10-220/2

---

එල්.ඩී.බී 7/2009.

**1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත**

1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනතේ 38 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
සෞඛ්‍ය අමාත්‍යවරයා.

2012 සැප්තැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

1985 දෙසැම්බර් මස 02 වැනි දින අංක 378/3 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1984 අංක 38 දරන උපකරන නියෝගවල 42 වන නියෝගයෙන් ඉක්බිතිවම පහත දැක්වෙන නියෝගය ඇතුලත් කිරීමෙන් එකී නියෝග මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එම නියෝගය 42 අ නියෝගය වශයෙන් බලාත්මක විය යුතු ය.

"42 අ (1) අධිකාරියේ පූර්ව ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තකු යම් උපකරණයක් ප්‍රචාරනය කරනු නොලැබිය යුතු ය.

(2) මෙම නියෝගය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට මාස දෙකක කාල සීමාවක් ඉකුත්වීමෙන් පසු බලාත්මක විය යුතු ය."

10-220/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.